# දෙමුහුන්කරණය

ඩී.පී.අයි.එල්.ප්‍රසංගිකා

ලියනගේ අමරකීර්ති සිය සිව්වෙනි නවකතාව වන අහම්බකාරක මඟින් ජීවිතයේ අහම්බමය ස්වභාවය ගවේෂණය කරන්නේ අහම්බය ඉරණම සේ ගත් පරම්පරාවක් සහ රටක් පිළිබඳ සංස්කෘතික ගවේෂණයක් ද සමගය. ගොළුවිජය හෙවත් විජය වික්‍රමසංහයන්ගේ කතාන්දරය එළිදක්වමින් බන්දුල බලගල්ල චරිතය විසින් අහඹුවේ පිළිබිඹුවක් සේ ස්වයං චරිතාපදානයක යෙදී ඇත. 2016 වර්ෂයේ ස්වර්ණ පුස්තක සම්මානයෙන් පිදුම්ලද "අහම්බකාරක" එක්තරා යුගයක ආධ්‍යාත්මය ගැන ගවේෂණයකි. එය පරිච්ඡේද හතරක පිටු 349ක් පුරා සිදුවන අහඹුවේ පෙළගැස්මකි. චර්ම වර්ණ, දේශසීමා ආදිය ඉක්ම වූ ආදරයක සහ මිත්‍රත්වයක කතාවකි.

බන්දුල බලගල්ල, මම ගොල්ෆ් ගගහා නිකම් සිටියෙමි..... මේ අක්කර තිස්පහ නගරයට හිසරදයක් බව මම දනිමි. නමුත් එය මට පුදුම සතුටකි. බලගල්ල වලව්වෙහි අහම්බයකින් ඉපිද නිකන් ම ගෙවන ජීවිතයේ අහම්බයෙන් මෙන් අතීතයට යන ඔහු, 19 වැනි සියවසේ ඉංග්‍රීසි නවකතා ඔහු අප සමග කියවූයේ වැකියෙන් වැකිය රස කරමිනි. ස්ටෙලා ඩැනියල්ස් නම් ලන්සි නෝනා පැමිණ අපට පියානෝ වාදනය ඉගැන්වූවාය. යනුවෙන් සිය පප්පාගේ යුගය සිහියට නගයි. මෙසේ සම්භාව්‍ය සංගීතයට ඇලුම් කිරීමට හුරුවන ඔහු බෙලෙක් සංගීතය බැහැර කරයි. ඒ නිසා මා සම්භාව්‍ය සංගීතය අසන්නේ, පියානෝව වයන්නේ ඉතා දැඩි ආඩම්බරයකිනි. එහෙත්, මම අහම්බයකින් මෙන් ඉතිහාසයේ අතරමඟට ඇදවැටුණු අහම්බකාරයෙක් වෙමි. එබැවින් මා එතෙක් සිටියේ තනියම මගේ වත්තේ ගෝල්ෆ් ක්‍රීඩාව කරමිනි. මගේ විනෝදයද කාන්සියද භාවනාවද වියවුලද එය විය. එනිසා ම මේ ගෝල්ෆ් පිටිය මගේම නිර්මාණයකි. එහිදී එල්ල කරන පහරවල් හා නීති රීති සියල්ල මගේය.... ගෙදර සිටින්නේ නම් මම හැමදාම හවසට ගෝල්ෆ් ගසමි. ඉලක්කය වෙත ගමන් කිරීම යන අහම්බය උදා කිරීම ගෝල්ෆ් ක්‍රීඩාවෙන් ලැබෙන ආනන්දයයි..... මගේම වත්තේ මම ම සාදාගත් ගෝල්ෆ් වළල්ල මගේ ජීවන වළල්ලයි; මගේ සක්මන් මළුවයි; භාවනා වීථියයි. අහම්බයෙන් මේ ස්වයං-සන්තෘප්තභාවයේ වළල්ලෙන් එළියට විත් මා ගොඩනැංවූ විජිතය ගැන ඔබට මේ ආඛ්‍යානයේ දී කියවන්නට ලැබේ......පොත් කියවීමේත්, භාෂා පාසැලක් දැමීමේත්, නාට්‍ය පුහුණු කිරීමේත්, කුරුණෑගල නාට්‍ය දර්ශන සංවිධානය කිරීමේත් පමණක් නොව, හැකි සෑම විටම කතා ඇසීමට යාමේත් රහස අනිකක් නොව..... මා මේ සටහන ලියන මොහොතේත් මගේ කොම්පියුටරයෙන් මගේ මිතුරිය කැත්රින් එවූ ප්‍රංශ ගීයක් වාදනය වේ. වික්‍රමසිංහ යුවලගේ නික්ම යාමත් සමග තනියම කල්පනා කිරීමට ඉඩක් නැත්නම් මත් වී දොඩමලු වීම ඊළඟ විකල්පය බව..... දැනසිටි ඔහු, පළමු මධුවිතෙන් බිඳක් තොලගෑ...... පසු ගොළු වූ විජය වික්‍රමසිංහ පිළිබඳ අතීතාවර්ජනයක යෙදේ. මං දැකල තියෙනවා ඕකා ජෝතිගේ සින්දු යනකොට කකුල නටෝනව චූන් එකේ. ජෝතිගේ මම ගන්නෙමී කරකාර... සින්දුවට ගොළුවිජේ ඇඟ පද්දනු බිල්ලා දැක තිබුණේය. සාජන් සහ මුදලාලි අතර මිත්‍රත්වය කෙතෙක්ද යත් මුදලාලිගේ ඉඳහිට කෙරෙන මධු සාදයට සාජන්ද එන්නට විය. ගොළුවිජේ කෝකි තනතුරු ලැබීමෙන් පසු රාත්‍රියට හෝටලේ වැසීමෙන් පසු නාගෙන කරගෙන ටවුමේ ගැවසීම ඔහුගේ පුරුද්දක් විය. ඒ අතරතුර විජයගේ චිත්‍රපට එකක් නැර බැලූ ගොළුවිජේ...... හැන්දෑවට එළිමහනට විත් නගරයේ ඇවිදීමට පෙර ඔහු කළ පළමු කාරිය අම්මා සිහි කර බෝගහ ළඟ පහනක් පත්තු කිරීමයි.....ඇය එහි එන විට මම සෙනසුරාදා අයිලන්ඩ් පුවතපත පෙරළාගෙන උන්නත්..... සාමාන්‍යයෙන් උදේ අවදි වන රාධා මගේ ගෙදරදී නම් කරන්නේ ගොල්ෆ් පිටිය වටා රවුමක් ඇවිද පැමිණ දාඩිය නිමෙනතුරු වත්තේ මල් හෝ පලතුරු ගස් යට ඇවිද ඇවිද මල්, කුරුල්ලන් හෝ අමුතු අමුතු බිම්මල් සොයමින් ඇතුගල දෙසින් හමන සුළඟට අනාවරණය වී සිටීමයි. හමුව හැන්දෑවේ හයට යොදාගෙන තිබුණද මා ගෝල්ෆ් වටයක් සෙල්ලම්කර..... ඇය මා හා ගමන් කළේ පොල්ගස්වල සෙවණැලි යට සිසිලෙන් සිසිලට පනිමිනි.... පිරිස ආවේම අනන්මනන් කෑම කන්නට නොව, බත්ම කන්නටය. ඒ නිසා සේදරමන් හෝටලයේ,එක් පාරිභෝගිකයකු වෙනුවෙන් අවශ්‍ය මේස ඉඩද කාලයද වැඩිය. එනම්, ඔවුන් හොයන්නේ සම්පූර්ණ වෙනසක්ම නොව, හුරුපුරුදු දේට එක් වූ වෙනසකි.
අහම්බකාරක පුරා පැතිරිණු විශ්‍රාන්තිය වූ කලී කිසිවිටෙකත් අහඹුවක් නොවන බව පැහැදිලිය. එය සැබෑ ජීවන සන්තෘෂ්ටිය පිළිබඳ පිළිබිඹුවකි.

ලියනගේ අමරකීර්ති (2016) අහම්බකාරක, (පස්වන මුද්‍රණය), ෆාස්ට් පබ්ලිෂින් (ප්‍රයිවට්) ලිමිටඩ්, 165, දේවානම්පියතිස්ස මාවත, කොළඹ 10.